**(හැඳින්වීම)**

අද සාමාන්‍ය සමයේ 14 වන ඉරුදිනය යි. අදට නියමිත පළමු දේව ප්‍රකාශනය මගින් විප්‍රවාසයෙන් පසු, ආපසු පැමිණෙන ඊශ්‍රායෙල් ජනතාවගේ ප්‍රීතිය පිළිබඳව සහ ජෙරුසලම් නගරය මවක මෙන් ආදරයෙන් ඔවුන් පිළිගන්නා ආකාරය ප්‍රකාශ කරයි. කුරුසිය හැර අන් කිසිවක් ගැන පාරට්ටු කර නොගන්නා බව ද එම ප්‍රතිපත්තිය අනුගමනය කරන්නන්ට සාමදානය සහ දයාව හිමිවන බව ද දෙවන දේව ප්‍රකාශනය මගින් ශුද්ධ වූ පාවුළු තුමන් අපට පවසයි.

ගොයම බහුල නමුත් ගොවීහු විරල යැයි ද, ලෞකික ජයග්‍රහණ වෙනුවෙන් නොව, තම නාමය ස්වර්ගයෙහි ලියා ඇති නිසා සන්තෝෂ වන්න යැයි ද අදට නියමිත සුවිශේෂයෙන් ප්‍රකාශ වේ.

එබැවින් අප සැම ද සාමය වන දෙවියන් වහන්සේ සමඟ බද්ධ වෙමින්, එම සාමය අන් අය වෙත ගෙන යන උපකරණ වන්නට ද මමත්වය පසෙකලා කුරුසිය උදෙසා සාක්ෂි දරන්නට ද අවැසි දෙව් වරම් සහ මඟ පෙන්වීම ඉල්ලා, මෙම දිව්‍ය යාගයට බැති සිතින් සහභාගී වෙමු.

**(විශ්වාසිකයන්ගේ යැදුම්)**

අපගේ පිළිතුර - ස්වාමිනී, අප කරන යාච්ඤා අසා වදාළ මැනව.

1) ආදර දෙවි පියාණනී, ඔබවහන්සේගේ කැඳවීමට අවනත වෙමින්, සමිඳු කෙත අස්වැද්දීමේ කාර්යයේ නිරත වන ෆ්‍රැන්සිස් සුදතුම් පියතුමන් ඇතුළු පූජක සහ පැවිදි සැමට අවැසි ශාරීරික හා මානසික සුව සහනය නිරතුරු දානය කර, වඩාත් බහුල ලෙස දේව කැඳවීම් අප පවුල්වල දූ පුතුන් වෙත දානය කරන පිණිස,

2) සියලු බලැති දෙවි පියාණනී,  ශ්‍රී ලංකා දේශය ඇද වැටී ඇති දරුණු අගාධයෙන් මිදී, සමෘද්ධිමත්ව සහ මානව දයාවෙන් පිරිපුන්ව යළි නැඟී සිටින්නට අවශ්‍ය සුදතුම් මඟ පෙන්වීම සියලු ජන නායකයන්ට සහ ලක් වැසියන්ට දානය කරන පිණිස,

3) ආදර දෙවි පියාණනි, ලොව පුරා පැතිර යන යුද ගිනිදැල් නවත්වා බලය සහ මාන්නය ඉවත දමා ලෝකය පුරා සාමය පිහිටුවීමට අවශ්‍ය ප්‍රඥාව සහ මග පෙන්වීම ලෝක ජන නායකයන් හට ලබා දෙන පිණිස,

4) අබ්බා පියාණනී, කුරුසියේ මාර්ගයේ යමින් සැම දෙනා සමඟ සාමයෙන් සමගියෙන් වාසය කරන්නටත්, අන් අයගේ අවශ්‍යතාවයන් තේරුම් ගනිමින් ඒවාට සංවේදී වන්නටත් අවශ්‍ය කරන්නාවූ දයාවන්ත සිතක් අප සැම හට දානය කරන පිණිස,